**පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපොළ සංකීර්ණ කළමනාකරණ භාරය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපොළ සංකීර්ණ කළමනාකරණ භාරයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, භාරයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, භාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය භාරය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාරයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
භාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, භාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් භාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ භාරයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ භාරයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, භාරය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 1හි ඡේද අංක 48 ට අනුව අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතුය ලෙස දක්වා තිබුණ ද, ඉදිරියට ගෙවන ලද රු.232,791 ක බදු කුලිය ණයගැතියන්ට හිලව්කර තිබුණි. ඒ අනුව වර්ෂ අවසාන ණයගැති ශේෂය හා ඉදිරියට ගෙවන ලද බදු කුලිය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විගණකාධිපති වාර්තාව සමඟ එකඟවේ. 2023 ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉදිරියට ගෙවන ලද බදු කුලිය හිලව් නොකර ඉදිරියට ලැබීමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | රු.1,347,223 ක් වටිනා ලී බඩු හා සවිකිරීම් සහ රු.139,942 ක කාර්යාලීය උපකරණ වටිනාකම් ඉකුත් වර්ෂයේ දී සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීව කාලය අඩුතරමින් සෑම වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු වුවත් භාරය විසින් ප්‍රමිත ප්‍රකාරව කටයුතු නොකර සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ වත්කම් තවදුරටත් භාවිතාකරමින් පැවතුණි. | කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම ප්‍රායෝගික නොවන බැවින් එම අයිතම ප්‍රත්‍යාගණනය කර නැත. | සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණ ද දිගින් දිගටම ප්‍රයෝජනයට ගනු ලබන වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගැළපීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 17 අනුව එක් එක් ආදායම් ප්‍රභව සම්බන්ධයෙන් වෙන වෙනම ලෙජර් ගිණුම් පවත්වා ගෙනගොස් නොතිබුණු බැවින් රු.144,197,265ක් වූ ආදායම් ප්‍රභව 8 කින් සමන්විත භාරයේ එක් එක් ආදායම් ශේෂයේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට විගණනයට නොහැකි විය. | විගණකාධිපති වාර්තාව සමග එකඟවේ. දක්වා ඇති ආදායම් ප්‍රභව 8 සඳහා වෙන් වෙන්ව ලෙජර් ගිණුම් සකස් කර ලෙජරය නිවැරදි කර ඇත. | එක් එක් ආදායම් ප්‍රභව සම්බන්ධයෙන් වෙන වෙනම ලෙජර් ගිණුම් පවත්වාගත යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති 7 හි 69 ඡේදය ප්‍රකාරව වත්කමක ක්ෂය ගණනය කිරීම ආරම්භ කළ යුත්තේ එය භාවිතා කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද භාරයේ සියලුම වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපත්තිය වශයෙන් සෑම වර්ෂයකම ජනවාරි 01 දිනට වත්කමෙහි වටිනාකම පදනම් කරගෙන ක්ෂය ගණනය කරන බව දක්වා තිබුණි. එසේ වුවද පරිශ්‍රය සංවර්ධනය දේපළ පිරියත අයිතම සඳහා වර්ෂය තුළ රු.7,671,757 ක එකතුකිරීම් ද සමඟ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින පැවති ශේෂය මත ක්ෂය ගණනය කර තිබුණි. ඒ අනුව භාරයේ ක්ෂය ප්‍රතිපත්තිය හා ක්ෂය ගණනය කිරීම ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුකූල නොවන බව නිරීක්ෂණය විය. | ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ පදනම වාර්ෂික ගිණුම්වල දක්වා ඇති අතර ප්‍රමිත අංක 07 අනුව සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කරනු ලැබේ. | වත්කමක් භාවිතා කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව ක්ෂය ගණනය කිරීම ආරම්භ කළ යුතු අතර ක්ෂය ප්‍රතිපත්තිය අනුව ක්ෂය ගණනය කිරීම සිදුකළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 89738653 දරන රු.29,592,973 ක ස්ථාවර තැන්පතුව සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලිය රු.320,253 ක් වුවද එදිනට ලැබිය යුතු නිවැරදි පොලිය රු.1,339,426 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු පොලී ආදායම රු.1,019,173 ක් අඩුවෙන් ද අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද දක්වා තිබුණි. | විගණකාධිපති වාර්තාව සමග එකඟ වේ. පොලී ප්‍රතිශතය යතුරු ලියන දෝෂයකින් අඩුවෙන් සටහන්වීම නිසා මෙය සිදු වී ඇති අතර 2023 ගිණුම් සකස් කිරීමේදී පෙර වර්ෂ ගැළපීම් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ස්ථාවර තැන්පතු වලට අදාළ පොලිය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | කෙටිකාලීන ස්ථාවර තැන්පතු අංක 87978159, 87978188 සහ 87978207 සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන අනුව ලැබී තිබූ පොලිය පිළිවෙලින් රු.129,459 ක්, රු.4,592,973 ක් සහ රු.959,969 ක් වුවද ස්ථාවර තැන්පතු අලුත් කිරීමේ නිවේදන අනුව වර්ෂය තුළ ලැබී තිබුණු පොලිය පිළිවෙලින් රු.61,877, රු.3,414,959 සහ | විගණකාධිපති වාර්තාව සමග එකඟ නොවේ. 2022-01-01 දින සිට මෙම තාවකාලික ස්ථාවර තැන්පතු වරින් වර ආයෝජනය කර ඇති අතර එහි සම්පූර්ණ පොලිය ගිණුම්ගත කර ඇත. ඒ අනුව ගිණුම්ගත කර ඇති මුදල නිවැරදි වේ. | ස්ථාවර තැන්පතු අලුත් කිරීමේ නිවේදනයන්හි දැක්වෙන පොලිය ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.195,584 ක් වූයෙන් රු.2,009,981 ක පොලිය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඈ) | 2011 වර්ෂයේ සිට භාරයේ බැංකු ගිණුම වෙත සෘජුව ලැබී තිබුණු එකතුව රු.5,642,410 ශේෂයක් හඳුනානොගත් ලැබීම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට, ණයගැතියන්ගෙන් අඩුකර දක්වා තිබුණු බැවින් ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. | විගණකාධිපති වාර්තාව සමග එකඟවේ. 2023 ගිණුම් සකස් කිරිමේදී නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත. | හඳුනානොගත් ලැබීම් හිලව් නොකර හඳුනානොගත් ලැබීම් ලෙස හෙළිදරව් කළ යුතුය. මෙම ශේෂය නොපමාව හඳුනාගෙන එම ගිණුම අහෝසි කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ ගෙවිය යුතු ආරක්ෂක වියදම වූ රු.1,406,833 ක මුදල ගිණුම්වලින් මඟහැරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආරක්ෂක සේවා වියදම් හා ජංගම වගකීම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු අතර වර්ෂයේ අලාභය ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විගණකාධිපති වාර්තාව සමග එකඟවේ. 2023 ගිණුම් සකස් කිරිමේදී පෙර වර්ෂ ගැළපීම් යටතේ නිවැරදි කරනු ලැබේ. | සමාලෝචිත වර්ෂයට අදාළ ආරක්ෂක වියදම් නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | පිරිවැය රු.1,054,400 ක් වටිනා සීසීටීවී උපකරණ අක්‍රිය වීම නිසා ගලවා ඉවත් කර ගබඩා කර තිබුණ ද, එය අපහරණය කර පොත්වලින් ලියා හැරීමට කටයුතු කර නොතිබුණි. | අක්‍රිය වූ ඉවත් කරන ලද ක්ෂය උපාංග ගබඩාවේ ගබඩා ගතකර ඇත. ඉදිරියේදී අපහරණය කිරිමෙන් පසු මෙම අගය ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස විෂය භාර නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදී. | භාවිතා නොකරන ගලවා ඉවත් කරන ලද සීසීටීවී උපකරණ අපහරණය කර පොත්වලින් ලියා හැරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2021 වර්ෂයේ මිලටගන්නා ලද රු.1,436,130 ක් වටිනා වාහන රථගාල පාලනයට යොදාගනු ලබන මෘදුකාංග පද්ධතිය සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව සියයට 20 ක ප්‍රතිශතයට රු.287,226 ක් ක්ෂය ගණනය කර නොතිබුණු බැවින් වර්ෂයේ අලාභය ද එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි. | විගණකාධිපති වාර්තාව සමග එකඟවේ. 2023 වර්ෂයේ දි පෙර වර්ෂ ගැළපීම් මගින් නිවැරදි කරනු ලැබේ. | ක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වර්ෂය ආරම්භයේ දී සහ අවසානයේ දී ඇතැති මුදල් ලෙස දක්වා තිබෙන රු.22,623 ක ශේෂය භෞතිකව පවතින ශේෂයක් නොවන බව නිරීක්ෂණය විය. | 2022 ජනවාරි 01 දිනට ද මෙම ශේෂය රු.22,623 ක් විය. වාර්ෂික මුදල් ප්‍රවාහයට ගලා ඒමක් හෝ ගලා යාමක් සිදු නොවූ එබැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ 2022 දෙසැම්බර් 31 දිනට මෙම ශේෂයේ බලපෑමක් නැත. | මෙම ශේෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට පියවර ගත යුතුය. |

### 1.5.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස (අඩුවීම්)/ වැඩිවීම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| (අ) | ලැබිය යුතු වෙළඳසැල් කුලී ආදායම | 9,395,660 | 11,450,099 | 2,054,439 | ලෙජරය නිවැරදිවේ. ලෙජරයේ එකතුව කාල විශ්ලේෂණයේ අවසන් එකතුව හා සමාන වේ. කුලී අදායමට පෙර වසර වල ගැළපීම් සිදුකළ පසු සැසදීම් කර ඇත. | ශේෂයන් අතර වෙනසට හේතු සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වාහන ගාල් කිරීම වෙනුවෙන් ලංකා ධීවර සංස්ථාවෙන් ලැබිය යුතු ශේෂය | 17,402,781 | 6,480,459 | 10,922,322 | භාරයේ තොරතුරු අනුව ලංකා ධීවර සංස්ථාවෙන් අයවිය යුතුව ඇති ශේෂය රු.17,402,781 ක් වේ. ඉදිරියේදී මේ පිළිබඳව ශේෂ සනාථන ලබා ගැනිමට කටයුතු කරන ලෙස අදාළ විෂය භාර නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදී. | ශේෂයන් අතර වෙනස්කම් සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | භාරයේ කාර්යාලය නවීකරණයට අදාළ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට ගෙවිය යුතු ශේෂය | 6,964,161 | 10,427,586 | 3,463,425 | විගණකාධිපති වාර්තාව සමග එකඟ නොවේ. CECB ආයතනයට ගෙවීම් කරනු ලබන්නේ ඉංජිනේරුවරයා විසින් සහතික කර ඇති ප්‍රමාණයට පමණි. ඒ අනුව ගෙවීමට නිර්දේශිත ප්‍රමාණය ගිණුම්ගත කර ඇත. | ශේෂයන් අතර වෙනස්කම් සොයා බලා නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ඉඩම් | 382,429,934 | 375,141,765 | 7,288,169 | ලෙජරය නිවැරදිවේ. පරිශ්‍ර සංවර්ධනය පෙර වියදමක් ගැලපීම් කිරීමේදී යතුරු ලියන දෝෂයකින් ඉඩම් වලට එකතුවීම | මූල්‍ය ප්‍රකාශන හා අනුරූපි වාර්තා අතර වටිනාකම් සඳහා වෙනසට හේතු පරික්ෂා කර නිවැරදි අගය ගිණුම්ගත කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | හේතුවෙන් මෙය සිදුවී ඇත. අවසාන ශේෂයට මින් බලපෑමක් නැත. | |
| (ඉ) | පරිශ්‍ර සංවර්ධනය | 113,749,963 | 106,078,206 | 7,671,757 | ලෙජරය නිවැරදිවේ. පරිශ්‍ර සංවර්ධනය පෙර වියදමක් ගැලපීම් කිරීමේදී යතුරු ලියන දෝෂයකින් ඉඩම් වලට එකතුවීම හේතුවෙන් මෙය සිදුවී ඇත. අවසාන ශේෂයට මින් බලපෑමක් නැත. | මූල්‍ය ප්‍රකාශන හා අනුරූපි වාර්තා අතර වටිනාකම් සසඳා වෙනසට හේතු පරීක්ෂා කර නිවැරදි අගය ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.5 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | හිඟ කඩකුලී | 81,141,044 | හිඟ කඩකුලී නාම ලේඛනය/ලෙජර් ගිණුම් | එක් එක් වෙළඳසැල් වෙනුවෙන් වෙන් වෙන් වූ ගොනු පවත්වාගෙන යනු ලැබේ. | එක් එක් වෙළඳසැල් වෙනුවෙන් කඩ කුලී ලේඛනයක් සහ ලෙජර් ගිණුම් පවත්වා ගෙන යා යුතුය. |
| (ආ) | ආපදා ණය | 87,352 | ලෙජර් ගිණුම් | වැටුප් පත් පරීක්ෂා කිරීමෙන් මෙම ආයතනයන්හි නිරවද්‍යතාවය සනාථ කර ගත හැකිවේ. අයවීම් පිළිබඳ තොරතුරු ඉල්ලා සිටියේ නම් ලබා දිය හැකිව තිබුණි. | ආපදා ණය සම්බන්ධයෙන් ලෙජර් ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | රඳවා ගැනීම් | 28,670,857 | ලෙජර් ගිණුම් | විගණකාධිපති වාර්තාව සමග එකඟවේ. ලෙජර ගිණුම් නිවැරදිව යාවත්කාලීන කරන ලෙස අදාළ නිළධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. | ලේජර් ගිණුම් නිවැරදිව යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඈ) | ආපසු ගෙවිය යුතු තැන්පතු | 5,500,000 | ශේෂයේ පැවැත්ම හා නිවැරදිතාවය සනාථ කෙරෙන ලියවිලි | මෙම මුදල රජයේ ආදායමට ගිණුම්ගත කිරිමට 59 වන කළමණාකරණ භාර රැස්වීමේදී අනුමැතිය ලබාගත් අතර, එය ඉදිරියේ දී ගිණුම් ගත කරනු ලැබේ. | මුදල් ලැබීම සනාථ කෙරෙන ලියවිලි ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | වර්ෂ අවසාන ක්ෂය ලැබිය යුතු පොලි යනාදි ගිණුම් 05 කට අදාළ ගැළපිම් | 80,138,884 | ජ'නල් සටහන් | විගණකාධිපති වාර්තාව සමග එකඟවේ. 2023 වර්ෂයේ ජර්නල් සටහන් නිවැරදිව සකස් කරන ලෙස විෂය භාර නිළධාරියාට උපදෙස් ලබදෙන ලදී. | ජ'නල් සටහන් විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රු.81,141,044 ක් වූ ණයගැතියන් සඳහා භාරය විසින් අඩමාණ ණය වෙන් කර නොතිබුණු අතර ණයගැතියන්ගෙන් රු.55,152,854 ක් එනම් ණයගැතියන්ගෙන් සියයට 68 ක ප්‍රමාණයක් වර්ෂ 3 ක් ඉක්මවූ ණයගැතියන් විය. | අඩමාණ ණය වෙන්කිරිම සඳහා මෙම ණයගැතියන් පිළිබඳ හොඳින් අධ්‍යනය කළ යුතුවේ. මේ පිළිබඳව කමිටුවක් පත් කර ඇති අතර එහි තීරණය අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර කල්ගත වූ ණයගැතියන් සඳහා අඩමාණ ණය වෙන් කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය VII පරිච්ඡේදය 12 ඡේදය 12.2.1 | රජයේ නිලධාරියෙක් තනතුරක වැඩ බැලීම සඳහා හෝ තනතුරක රාජකාරි ඉටුකිරීම සඳහා හෝ පත්කළ යුත්තේ එම තනතුර එම රජයේ නිලධාරියා දැනට දරන තනතුරට වඩා ඉහළ තත්ත්වයේ තනතුරක් හෝ සම තත්ත්වයේ තනතුරක් වන්නේ නම් පමණක් වුවද තම ස්ථිර තනතුරට පහළ තනතුරු දෙකක් වන භාරයේ ගණකාධිකාරි සහ කළමනකරු තනතුරුවල වැඩ බැලීම සඳහා ධීවර අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි සහ ධීවර අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු පත්කර තිබුණි. එම වැඩ බැලීමේ පත්වීම් වෙනුවෙන් දීමනා ලෙස 2016 පෙබරවාරි 19 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු.4,017,403ක මුදලක් ගෙවා තිබුණි. | වෙළඳ සංකීර්ණයේ සියලු තනතුරු සඳහා පත්වීම් බලධාරියා පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරය වන අතර එම භාරයේ අනුමැතිය පරිදි මෙම පත්වීම් සිදුකර ඇත. | තනතුරක වැඩ බැලීම සඳහා පත් කිරීමේ දී එම නිලධාරියා දැනට දරන තනතුරට වඩා ඉහළ හෝ සම මට්ටමේ තනතුරක් විය යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ. 137 | රෙගුලාසියට පටහැනිව නිලධාරියකුගේ අනුමැතියක් නොමැතිව භාරයේ සභාපති, කළමනාකරු හා ගණකාධිකාරි යන තනතුරු සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී අවස්ථා 12 කදී රු.1,140,000 ක් ගෙවා තිබුණි. | මෙම ගෙවීම් සිදු කර ඇත්තේ මු.රෙ. 35 බලතල පැවරීම අනුව ඊට බලතල ඇති ගෙවීම් අනුමත කරනු ලබන නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන ඇත. | නිසි අනුමැතිය මත පමණක් ගෙවීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) මු.රෙ. 225(2) | අතිකාල සඳහා අදාළ වන පොදු 35(අ) වවුචර් පත් වෙනුවට භාරයේ ගෙවීම් වවුචරයක් මඟින් සමාලෝචිත වර්ෂය තුළ අතිකාල දීමනා ලෙස රු.6,290,612 ක මුදලක් ගෙවීම් කර තිබුණි. | පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ අතිකාල ගෙවනු ලබන්නේ ලංකා ධීවර සංස්ථාව විසින් සකස් කරන ලද ආකෘති පත්‍රයකට අනුවය. | අතිකාල සඳහා පොදු ආකෘති පත්‍ර භාවිතා කළ යුතුය. |
| (iii) මු.රෙ. 502(2) | ස්ථාවර වත්කම් රෙජිස්ටරයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර 2022 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් ද සිදුකර නොතිබුණු බැවින් රු.2,341,721,086 ක් වූ ස්ථාවර වත්කම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | භාරය මඟින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ. විගණනයෙන් පෙන්වා දී ඇති කරුණුද සැළකිල්ලට ගෙන එම ලේඛන තවදුරටත් වැඩි දියුණු කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. 2022 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඇත. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යා යුතු අතර එම වත්කම් සමීක්ෂණය කළ යුතුය. |
| (ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් ඇතුළත් කරන ලද මු.රෙ. 876(2)(අ) | අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් පාර්ලිමේන්තු පනතක් මඟින් එම අරමුදල නීතිගත කළ යුතු වුවත් මෙම විගණන වාර්තාවේ දිනය දක්වා පාර්ලිමේන්තු අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | අරමුදල පනතක් මඟින් සම්මත කර ගැනීම සඳහා කෙටුම්පතක් සකස් කරමින් පවතින අතර එහි කටයුතු අවසන් අදියරේ පවතී. | පාර්ලිමේන්තු පනතක් මඟින් අරමුදල නීතිගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) 2010 අගෝස්තු 10 දිනැති භාර ඔප්පුව | | | |
| (i) වගන්ති 6(අ)(i) | භාරයේ සියලුම ඉතිරිකිරීම් අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල, ආණ්ඩුවේ සුරැකුම්පත්වල හැර වෙනත් යම් ආකාරයකින් ආයෝජනය කිරීමට භාණ්ඩාගාරයේ පූර්ව ලිඛිත එකඟතාවයක් ලබාගත යුතු වුවත් එවැනි එකඟතාවයක් නොමැතිව කළමනාකරණ භාරය විසින් භාරකාර මණ්ඩලයේ තීරණයන් මත පමණක් එකතුව රු.284,724,181 ක මුදලක් ලංකා බැංකුවේ හා ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථිර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. | කළමනාකරණ භාරයේ ස්ථාවර තැන්පතු වල මුදල් ආයෝජනය කර ඇත්තේ භාරයේ අනුමැතියෙන් වන අතර, භාරකරුවන්ට ලැබෙන විශේෂ බලතල යටතේ එය සිදුකර ඇත. | ගිවිසුමට පටහැනිව ආයෝජනය කිරීමේ දී භාණ්ඩාගාරයේ පූර්ව ලිඛිත එකඟතාවය ලබාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | වගන්ති 7(අ) | ආණ්ඩුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් ලබා ගනු ලබන තක්සේරුව පදනම් කොටගෙන තීරණය කරනු ලබන බදු කුලියක් තොග වෙළඳුන්ගෙන් හා සිල්ලර වෙළඳුන්ගෙන් වෙළඳසැල් සඳහා අයකර ගත යුතු වුවත්, දැනට අයකරනු ලබන රු.40,000 ක් හා රු.10,000 ක්වූ වෙළඳසැල් කුලිය එකී නියමයට පටහැනිව කළමනාකරණයේ තීරණය මත අයකර තිබුණි. එමෙන්ම වසර 12 ක් ගත වී ඇතත් එම බදු කුලිය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | බදුමුදල් සංශෝධනය කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් බදු තක්සේරුවක් ඉල්ලා ඇති අතර එය ලද පසු අවශ්‍ය අනුමැතින් ලබා ගෙන ඉදිරි කටයුතු කරනු ඇත. | රජයේ තක්සේරුකරුගේ තක්සේරුවක් මත වෙළඳසැල්වලින් බදු අය කළ යුතුය. |
| (iii) | වගන්ති 7(ඇ) | සංකීර්ණය තුළ මසුන් හැසිරවීම සෞඛ්‍යානුකූලව සිදුකිරීමට වෙළඳාම් කරනු ලබන මත්ස්‍ය ආහාර සෞඛ්‍ය හා ගුණාත්මකභාවය නියමිත ප්‍රමිතියකට පවත්වාගෙන යන බවට සහතික කිරීමට පියවර ගතයුතු බව දැක්වෙතත් ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හෝ නීති හඳුන්වා දී නොතිබුණු හෙයින් එම කටයුතු පරික්ෂා කිරීමට ක්‍රමවේදයක් හඳුනාගත නොහැකි විය. | වෙළඳ සංකීර්ණය තුළ සෞඛ්‍යාරක්ෂිතව මසුන් හැසිරවීම පිළිබඳ අවශ්‍ය දැනුවත් කිරීම් ධීවර දෙපාර්තමේතුව,පෑලියගොඩ නගරසභාව, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, නාරා ආයතනය වැනි ආයතන සමග එක්ව නිරන්තරව සිදු කරනු ලැබේ. ඊට අමතරව නගරසභාව හා නාරා ආයතන මගින් අහඹු පරික්ෂා කිරීම්ද සිදුකරයි. | සෞඛ්‍යාරක්ෂිතව මසුන් හැසිරවීම සඳහා මාර්ගෝපදේශ හෝ නීති හඳුන්වාදිය යුතුය. |
| (iv) | වගන්ති 7(ඉ) | භාරයට අයත් තොග වෙළඳසැල් 154 ක් හා සිල්ලර වෙළඳසැල් 128 ක් බදු දීම සඳහා භාර මණ්ඩලය විසින් අනුමත ලිඛිත නිර්ණායක සකස් කළ යුතු වුවත් එබඳු නිර්ණායක සකස් නොකර විනිවිදභාවයකින් තොරව 2011 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාම බදුදීම සිදුකර තිබුණි. | මේ සම්බන්ධව ඉදිරියේදී පියවර ගනු ඇත | වෙළඳසැල් විනිවිදභාවයකින් යුතුව බදුදීම සඳහා ලිඛිත නිර්ණා<br>යක හඳුන්වාදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) වගන්ති 7(ග) | භාරයේ දේපළ ආරක්ෂා කරගැනීම සඳහා නඩු පැවරීමට හෝ නඩුවල දී විත්ති වාචික ඉදිරිපත් කිරීමට හැකි බව දක්වා තිබුණ ද 2011 වර්ෂයේ සිට බදු දී ඇති වෙළඳසැල් 282ක් සඳහා රු.81,141,044 ක හිඟ මුදල් අයකර ගැනීම සඳහා නඩු පැවරීමට ප්‍රමාණවත් සාක්ෂි ආයතනය තුළ තබා ගැනීමට කටයුතු කර නොතිබුණු බැවින් එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා නඩු දමා නොතිබූ අතර එයට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධව ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම ණය ශේෂයන් වසර 10කට වඩා දීර්ඝ කාලයක සිට පැවත එන ණය ශේෂයන් වන අතර නඩු පවරන්නේ නම් ඊට අදාළ ගිවිසුම් ආදිය සොයා ගැනිමේ අපහසුතාවයක් පවතී. එහෙත් මේ වන විට මෙවන් තත්වයක් ඇතිවීම අවම වන පරිදී කටයුතු කර ඇත. | නීති මාර්ගයෙන් හෝ කටයුතු කර හිඟ වෙළඳසැල් කුලී අයකරගත යුතුය. වගකිව යුතු භාරයේ නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය. |
| (vi) වගන්ති 8(අ) | භාරකරුවන්ගේ කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය වන ඕනෑම වාර ගණනක් භාරකරුවන්ගේ රැස්වීම පැවැත්විය හැකිය. ඒ අනුව යටත් පිරිසෙන් මාස 2 කට වරක්වත් එම රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබුණු රැස්වීම් වාර ගණන 02 ක් විය. ඒ අනුව අවම රැස්වීම් ප්‍රමාණයක්වත් පවත්වාගෙන නොතිබුණි. | 2022 වර්ෂයේ රටතුල ඇතිව තිබූ අස්ථාවර භාවය සහ ඉන්ධන ගැටළු හේතුවෙන් නිසිපරිදි භාර රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. 2023 වර්ෂයේදී එය මඟහරවා ගෙන අවශ්‍ය පරිදී කටයුතු කරනු ඇත. | අවම වශයෙන් මාස 2 කට වරක්වත් භාරකරුවන්ගේ රැස්වීම් පැවැත්විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.17,851,060 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 29,620,704 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 11,769,644 ක ඌනතාවයේ අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම ඌනතාවයේ අඩුවීමට ආදායම රු. 24,584,909 කින් වැඩිවීම හා වෙනත් වියදම් රු. 935,387 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාරයේ කාර්ය මණ්ඩලය අනුමත වී වසර 6 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද භාරයේ කළමනාකරු, ගණකාධිකාරී හා අභ්‍යන්තර විගණක යන තනතුරු සඳහා 2022 දෙසැම්බර් 31 වන විටත් බඳවා ගැනීම් සඳහා වන පරිපාටිය අනුමත කරවාගෙන බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | කළමනාකරණසේවා දෙපාර්තමේන්තුව මගින් කාර්යමණ්ඩලය අනුමත කරවාගෙන ඉන් කොටසක් සඳහා බඳවාගැනීම් සිදු කොට ඇත. ඉදිරියේදී ඉතිරි සේවක පිරිස බඳවා ගැනීමට කටයුතු කරනු ඇත. | බඳවා ගැනීම් පරිපාටිය අනුමත කරවා ගෙන අනුමත තනතුරුවලට ස්ථිර පදනමින් බඳවා ගැනීම් සිදුකළ යුතුය. |
| (ආ) | 2022 මාර්තු 08 දින පැවති 57 වන භාර මණ්ඩල රැස්වීමේ දී භාර මණ්ඩල පත්‍රිකා අංක 2022/BM/410 මගින් පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපොළ සංකීර්ණය කළමනාකරණ භාරය සඳහා සාමාජිකයන් 6 කින් යුත් විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුව රැස් වී නොතිබුණි. අංක 01/2021 සහ 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යාවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.2(උ) ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් මාස 3 කට වරක් රැස්විය යුතු බව දක්වා තිබුණද, භාරයේ විගණන කමිටුව එම මාර්ගෝපදේශය අනුගමනය කර නොතිබුණි. | 2022 වර්ෂයේ රටේ පැවැති අස්ථාවර භාවය සහ ඉන්ධන අර්බුදය හේතුවෙන් මෙම කමිටු රැස්වීම් පැවැත්වීම අපහසුවිය. ඉදිරියේදී පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. | විගණන හා කළමනාකරණ කමිටු පත්කිරීම් සහ රැස්වීම් පැවැත්වීම සිදුකළ යුතුය. |
| (ඇ) | 2022 සැප්තැම්බර් 01 දිනැති භාර මණ්ඩල පත්‍රිකා අංක 2022/BM/418 මගින් පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපොළ සංකීර්ණයේ සුදු යකඩ අත් කරත්ත සේවාව පවත්වාගෙන යනු ලබන අය විසින් ගෙවිය යුතු මාසික සේවා ගාස්තුව ලෙස එකතුව රු.512,500ක් අවුරුදු 2 කට වැඩි කාලයක් ගෙවීම් පැහැර හැර තිබුණු නිසා ඔවුන්ගේ එම සේවාව ලබාගැනීම අවසන් කර, එකී සේවාව ඉදිරියේ ලබාගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් සකසන ලෙස තීරණය කර තිබුණ ද 2023 මැයි 31 දිනවන විටත් කළමනාකරණය විසින් එම සේවාව අවසන් කර හෝ නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | මෙම අත්කරත්ත සේවාව පිළිබඳ පැන නැගී ඇති ගැටලු නිරාකරණය වන පරිදි ඉදිරියේදී එය විධිමත් වනු ඇත. | සුදු යකඩ අත් කරත්ත සේවාව පවත්වාගෙන යාම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

(ඇ) අයිස් කැට සැපයීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| (i) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු කැඳවීම් ප්‍රසම්පාදන ක්‍රමය භාවිතා කළ යුතු වුවත්, 2021 මැයි මස 01 වන දින සිට 2022 අප්‍රේල් මස 30 දක්වා වසරක කාලයක් සඳහා සීමිත මිලගණන් කැඳවීම මඟින් අයිස් කැට සැපයුම්කරු තෝරාගෙන තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රමය තීරණය කරන්නේ භාරයට ලැබෙන කුලී ආදායම මත වන අතර ඒ අනුව කටයුතු කර ඇත. | ජාතික තරඟකාරී ලංසු කැඳවීම මඟින් ප්‍රසම්පාදනය කළ යුතුය. |
| (ii) | මිලගණන් ඉදිරිපත් කර තිබූ සමාගම් 03ම එකම ලිපිනයක පිහිටි එකම අධ්‍යක්ෂ මණ්ඩලයක් හා එකම කොටස්කරුවන් සහිත ආයතන 03 ක් බව විගණනයට නිරීක්ෂණය විය. | මෙම ආයතනයන් 08 හි ම තොරතුරු අන්තර්ජාලය ඔස්සේ සොයාගෙන ඇති අතර එහිදී එම ආයතනයන් වෙත වෙනම ලිපිනයන් දක්වා තිබේ. ලංසු ලේඛන ලියාපදිංචි තැපැලෙන් යොමු කර ඇත්තේ එකම ලිපිනයකට නොව අන්තර්ජාලයෙන් ලබාගත් ලිපිනයන් වලටය. එමෙන්ම එම ආයතනයන්ට අදාළ වෙන් වෙන්වූ ව්‍යාපාර ලියාපදිංචි සහතික තාක්ෂණික ඇගයීම් කමිටුවේදී ඇගයීමට ලක්ව ඇත. | ඉදිරිපත් කරන ලද ලංසු තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිවැරදිව ඇගයීම සිදුකළ යුතුය. |
| (iii) | ලංසු කැඳවීමකින් තොරව 2022 මාර්තු 01 දින කැට අයිස් සැපයීමේ කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉල්ලීමක් මත මෙම සේවාව පැරණි මිලට එම ආයතනයටම ලංසු කැඳවීමකින් තොරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) මාර්ගෝපදේශයට පටහැනිව 2022 මැයි 01 දින සිට 2023 අප්‍රේල් 30 දින දක්වා වූ කාලපරිච්ඡේදයකට නැවත කොන්ත්‍රාත්තුව දීර්ඝකර තිබුණි. | ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී මෙම තත්ත්වය පිළිබඳ සැළකිලිමත්ව සියලු ටෙන්ඩර් කරුවන් වෙත දැනුවත් කිරිමට කටයුතු කරනු ඇත. | නව ලංසු කැඳවීමක් මඟින් අදාළ කොන්ත්‍රාත්තුව පිරිනැමිය යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙළඳසැල් 128 කින් යුත් සිල්ලර වෙළඳ සංකීර්ණයේ වෙළඳසැල්වලින් 64 ක් 2012 වර්ෂයේ දී රු.9,625,540 ක් වැයකර තොග වෙළඳසැල් බවට පරිවර්තනය කර තිබුණි. විගණිත දිනය වූ 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම සංකීර්ණයේ සිල්ලර වෙළඳසැල් 35 ක් සහ පරිවර්තනය කළ තොග වෙළඳසැල් 9 ක් අලෙවි කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අලෙවි කටයුතු සඳහා යොදා නොගත් වෙළඳසැල් මෙහෙයුම් කටයුතු සඳහා යොදාගත යුතුය. |